I-111
29 AUG 2013

# චතුපටිසම්භිදා හා තදනුගත ඉගැන්වීම්වලින් ප්‍රකට වන බෞද්ධ සන්නිවේදන සංකල්පය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

28 SEP 2013
Recieved from Prof. R.W.
9/28

හසන්ත හෙට්ටිආරච්චි

2013

## නිබන්ධ සාරාංශය


චතුපටිසම්භිදා හෙවත් 'සිව්පිළිසිඹියා' බෞද්ධ සම්ප්‍රදාය තුළ ධර්මඥානය හා ධර්ම සන්නිවේදන හැකියාව පිළිබඳ ගරු නාමයක් වශයෙන් ආදිම යුගයේ සිට භාවිතා වූ පදයකි. එහි ධර්මඥානය පමණක් නොව ධර්ම සන්නිවේදන හැකියාව ද අන්තර්ගත වී තිබීම විශේෂත්වයකි. සරල හා පොදු අර්ථයෙන් ගත්විට 'සිව්පිළිසිඹියා' පහත සඳහන් පරිදි අර්ථකථනය කළ හැකිය.

1. අත්ථපටිසම්භිදා - අර්ථ හෙවත් කරුණු පිළිබඳ දැනුම හෙවත් ලෝකයේ විද්‍යමානවන සත්‍ය කරුණු පිළිබඳ අවබෝධය නැතහොත් ඵලය පිළිබඳ අවබෝධය.

2. ධම්මපටිසම්භිදා - එම කරුණු අතර පවතින හේතුඵල සම්බන්ධය පිළිබඳ දැනුම.

3. නිරුත්තිපටිසම්භිදා - ඉහත සඳහන් දැනුම භාෂාවට නැතිනම් ප්‍රකාශනයට හෝ සන්නිවේදනයට සම්බන්ධ වන ආකාරය පිළිබඳ දැනුම.

4. පටිභානපටිසම්භිදා - ඉහත අංශ තුනෙන්ම කියැවෙන දැනුම ඒකරාශී වීමෙන් පරිපූර්ණ අවබෝධයක් ගොඩනැගෙන ආකාරය පිළිබඳ දැනුම.

ලොව සියල්ල හේතුඵල ධර්මානුකූලව සිදුවන බව බුදු දහමේ මෙන්ම නූතන විද්‍යාවේ ද පිළිගන්නා සත්‍යයකි. බුදුදහමේ කේන්ද්‍රීය ඉගැන්වීම ද එයයි. ලෝකය හා සත්වයා පිළිබඳ පරිපූර්ණ දැනුමක් ඇති කර ගැනීමට හේතුඵලධර්මානුකූලව ලෝකයේ පැවැත්ම තේරුම් ගත යුතුය. 'අත්ථ' හා 'ධම්ම' යන අංග දෙකින් මෙම අවබෝධය කියැවේ.

අනතුරුව මෙම මානසික අවබෝධය ප්‍රකාශ කිරීම සඳහා භාෂා මාධ්‍යය උපයෝගී කර ගනු ලැබේ. එය නිවැරදිව සන්නිවේදනය කිරීමට නම් භාෂාවේ ස්වභාවය, භාෂාව හා දැනුම අතර සම්බන්ධය හා සන්නිවේදන ක්‍රම පිළිබඳ අවබෝධයක් අවශ්‍යය. නිරුත්ති යන්නෙන් එම අවබෝධය අපේක්ෂා කරනු ලැබේ. නිවැරදි දැනුම ලබන ආකාරයත් එය භාෂා මාධ්‍යයෙන් නිවැරදිව සන්නිවේදනය කෙරෙන ආකාරයත් දැන ගැනීම ප්‍රමාණවත් නොවේ. එම සන්නිවේදනය තුළින් ශ්‍රාවක ජනතාව තුළ නිවැරදි දැනුමක් ගොඩනැගෙන ආකාරය ද දැන ගත යුතුය. එනම් මනෝ විද්‍යානුකූලව සන්නිවේදනය තුළින් අවබෝධය ඇතිවන ආකාරය ද දැන ගත යුතුය. මෙහිදී ග්‍රාහකයා තුළ ඇතිවූ අවබෝධය පිළිබඳව සන්නිවේදකයාට ප්‍රතිපෝෂණයක් ද ලැබිය යුතුය. සන්නිවේදන ක්‍රියාවලිය පරිපූර්ණ වන්නේ එවිටයි. මෙය පටිභාන යන්නෙන් අදහස් වේ.

මෙම සිව් ආකාර පටිභානය හෙවත් දැනුම බුද්ධකාලයේ හා ඊට පසුවත් ඇතැම් රහතන් වහන්සේලාට තිබූ අතර ඇතැම් අයට නොතිබුණි. මෙහි විශේෂත්වය නම් රහත් නොවූ ඇතැම් ගිහි පැවිදි අය ද සිව්පිළිසිඹියාලාභීන් වීමයි. විසුද්ධිමග්ග-ඛන්ධනිද්දෙසයේ සඳහන් පරිදි මෙම චතුපටිසම්භිදා සේඛ-රහත් නොවූ හා අසේඛ - රහත් වූ යන දෙපිරිසටම අදාළ වේ.

ආනන්දථෙර

චිත්තගහපති

ධම්මික උපාසක

උපාලිගහපති

ඛුජ්ජුත්තරා යනුවෙන් පැවිදි ගිහි ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව මේ සියලු දෙනාටම සිව්පිළිසිඹියා තිබූ බව ප්‍රකටය. ඉන්පසු සිව්පිළිසිඹියා සංකල්පය බෞද්ධ සම්ප්‍රදායය තුළ මුල් බැසගෙන තිබූ බවට සාධක ඇත.

නූතන සන්නිවේදන සංකල්පයන්ට සාපේක්ෂව බලන විට චතුපටිසම්භිදා සංකල්පය හා ඒ හා බැඳුණු වෙනත් ඉගැන්වීම් වර්තමාන අවබෝධයට වඩා ඉහළ මට්ටමක පවතින බව කිව යුතුය.

නූතන සන්නිවේදන සංකල්පය වඩාත් ගැඹුරු හා පුළුල් සන්දර්භයක් තුළ ප්‍රසාරණය කිරීමට මෙම බෞද්ධ සංකල්පයෙන් ගත හැකි ආදර්ශ රාශියකි. හුදු ආගමික සන්දර්භයකට පමණක් සීමා නොවී පොදු සන්නිවේදන සංකල්පයක් වශයෙන් මේ තුළින් මතුවන කරුණු විශ්ලේෂණයකට භාජනය කොට සුවිශේෂත්වයකින් හා අනන්‍යතාවකින් යුතු නව බෞද්ධ සන්නිවේදන සංකල්පයක් ගොඩනැංවීම මෙම පර්යේෂණයේ පරමාර්ථයයි.

ඉහත සඳහන් අරමුණු පෙරදැරිකොටගෙන ආරම්භ කරන ලද මෙම පර්යේෂණයේ දී චතුපටිසම්භිදා සංකල්පය දෙස ඓතිහාසික විචාරාත්මක විග්‍රහාත්මක හා තුලනාත්මක දෘෂ්ටිකෝණයන්ගෙන් බලා මෙම අධ්‍යයනයෙහි යෙදුණු අතර එහි ප්‍රතිඵල එම දෘෂ්ටිකෝණයන්ට අනුකූලවන පරිදි ඉදිරිපත් කිරීමට පරිච්ඡේද පහක් සැලසුම් කරන ලදී.

කුමන සංකල්පයකට වුවද ඓතිහාසික පරිණාමයක් මෙන්ම අදාළ සන්දර්භයක් ද පවතී. එම පසුබිම හා සන්දර්භයෙන් වියුක්තව කිසිදු සංකල්පයක් විග්‍රහ කළ නොහැක.

එබැවින් මෙහි ප්‍රථම පරිච්ඡේදයෙන් පටිසම්භිදා සංකල්පයේ ආරම්භය, විකාසය හා එහි සාම්ප්‍රදායික ප්‍රකරණය ද විස්තර කොට ඇත. මෙහිදී මුල් බුදුසමයට මෙන්ම පසුකාලීන අර්ථකථන සාහිත්‍යයට ද අවධානය යොමුකොට ඇත.

මෙම සංකල්පයේ විශේෂත්වය හැදෑරීම සඳහා ඒ පිළිබඳ පරිපූර්ණ හා නිවැරදි විග්‍රහයක් සිදුකළ යුතුය. එබැවින් දෙවන පරිච්ඡේදයේ දී සාම්ප්‍රදායික අර්ථකථන සාහිත්‍යය උපයෝගී කර ගනිමින් ආදි බෞද්ධ පටිසම්භිදා සංකල්පය පිළිබඳ විවරණයක් ඉදිරිපත්කොට ඇත. දෙවැනි පරිච්ඡේදයේ එන විග්‍රහයෙන් මතුවන සියලු ...දගත් කරුණු විග්‍රහ කිරීම සඳහා මෙබඳු පර්යේෂණ ග්‍රන්ථ රාශියක් ලිවිය යුතුය. ...බැවින් අපගේ ප්‍රස්තුතයට අදාළ වන සන්නිවේදන සංකල්පයට සමගාමී කරුණු ...ණක් වෙන්කොට ගෙන තුන්වන පරිච්ඡේදයේ දී ඉන් මතුවන බෞද්ධ ...න්නිවේදන මූලධර්ම පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත්කොට ඇත. මෙහිදී ප්‍රස්තුත ...ය පුළුල් සන්දර්භයක් තුළ විකසනය කිරීමත් මෙම සංකල්පය වර්තමාන ලෝකයට ...ළ වන ආකාරය පැහැදිලි කිරීමත් සඳහා වර්තමාන සන්නිවේදන මූලධර්ම ...රෙහි ද අවධානය යොමුකරන ලදී.

පටිසම්භිදා සංකල්පයෙහි සන්නිවේදන මූලධර්ම හා බැඳුණු සම්මුති, පරමත්ථ ආදි තවත් භාෂාත්මක සංකල්ප පවතී. මාතෘකාවෙහි "තදනුගත ඉගැන්වීම්" යනුවෙන් අදහස් කෙරෙන්නේ එම සංකල්පයි. ඒවායින් වියුක්ත කොට පටිසම්භිදා සංකල්පය හැදෑරීම අසම්පූර්ණය. එබැවින් සිව්වැනි පරිච්ඡේදය වෙන්කරන ලද්දේ එම සමගාමී සංකල්ප විවරණය කිරීම සඳහාය.

ඉහත පරිච්ඡේද වලින් අනාවරණය වන සියලු කරුණු සම්පිණ්ඩනය කරමින් බෞද්ධ චතුපටිසම්භිදා සංකල්පයෙන් ප්‍රකට කෙරෙන සන්නිවේදන සංකල්ප සර්වකාලීන හා සාර්වත්‍රික අගයකින් යුක්ත බව පැහැදිලි කිරීමේ නිගමනයන් පස්වැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇත. නූතන සන්නිවේදන සංකල්පයේ නිම්වළලු ඉක්මවා ගිය යථාර්ථවාදී සන්නිවේදන සංකල්පයක් බුදුසමය සතු බව එමඟින් සනාථ කර ඇත.